# 2023/10/26 දින මීගහකිවුල ප්‍රාදේශීය සභාවේදී පැවති කළමනාකරණ කමිටු රැස්වීම් වාර්තාව

2023/10/26 වන දින පෙ.ව.09.00ට සභා ලේකම්තුමිය විසින් පැමිණ සිටි කලාප භාර විමර්ශන නිලධාරි ඩබ්.ඒ.එස්.ආර්.විජේසිංහ මහතා, කාර්මික නිලධාරි ආර්.එම්.එල්.ජේ.රත්නායක මහතා, ප්‍රධාන කළමනාකරණ සහකාර(වැ.බ.) ජී.කේ.ද සොයිසා මහත්මිය, සංවර්ධන නිලධාරි ඒ.ජී.චිත්‍රා මල්කාන්ති මහත්මිය, කළමනාකරණ සේවා නිලධාරි කේ.තරිඳු දර්ශන ප්‍රියකැළුම් මහතා හා විෂය නිලධාරි පිළිගනිමින් කළමනාකරණ කමිටුව ආරම්භ කරන ලදී.

මීළඟට, න්‍යාය පත්‍රානුකූලව සභා ලේකම්තුමිය විසින් 2023/10/12 දිනැති පසුගිය කමිටු රැස්වීම් වාර්තාව ඉදිරිපත් කරන ලදී. පසුගිය කමිටු රැස්වීම් වාර්තාව සත්‍ය වාර්තාවක් බව කමිටු සාමාජිකයින් ඒකමතිකව අනුමත කරන ලදී.

මීළඟට, න්‍යාය පත්‍රානුකූලව දිනට නියමිත කරුණු සාකච්ඡාවට භාජනය කරන ලදී.

I. ගමන් වියදම් හා ගෙවීම් වවුචර්පත් උපලේඛණය සඳහා අවශ්‍ය නිර්දේශය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කල වවුචර්පත්

a. ගමන් වියදම් හා ගෙවීම් වවුචර්පත් උපලේඛන

| අනු අංකය | නම හා විස්තරය | ගෙවූ මුදල | කමිටු තීරණය |
|---|---|---|---|
| 01. | සභා ලේකම්, ප්‍රාදේශීය සභාව, මීගහකිවුල - මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ නව බස්නැවතුම්පොලේහි ක්ෂේත්‍ර පරීක්ෂණ කටයුතු සඳහා පැමිණි අමුත්තන් සඳහා සංග්‍රහ කිරීම වෙනුවෙන් ලබාගත් අත්තිකාරම පියවීම. | 9,680.00 | නිර්දේශ කරන ලදී. |
| 02. | ගමගේ නලින් කුමාර අමරසේන මහතා, 197/B, ඇටියාවල, දන්කොටුව - A Step to English යන පොත මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම.(බිල්පත් අංක - 45) | 1,200.00 | නිර්දේශ කරන ලදී. |
| 03. | කළමනාකරු, මැග්වින් ට්‍රේඩ් සෙන්ටර්, බදුල්ල - කැල්කියුලේටර් 05ක් සහ ස්ටෙප්ලර් මැෂින් 05ක් මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම. (බිල්පත් අංක - 2046) | 12,550.00 | නිර්දේශ කරන ලදී. |
| 04. | සී/ස ඌව පළාත් සමුපකාර ග්‍රාමීය බැංකු සංගමය, බදුල්ල - A4 පැකට් සහ ස්ටෙප්ලර් කටු පැකට් (ලොකු) 10ක් මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම. (බිල්පත් අංක - 5256) | 46,450.00 | නිර්දේශ කරන ලදී. |
| 05. | ඩබ්.එම්.මනෝජ් ප්‍රියලාල් මයා - LDSP ව්‍යාපෘතියට අදාළව මීගහකිවුල කාර්ය සාධන ඇගයීම් ප්‍රශ්නාවලියෙහි ඇගයීම් කටයුතු සඳහා සහභාගී වූ විශ්ව විද්‍යාලීය ඇගයීම් කණ්ඩායමෙහි නිලධාරීන් සඳහා දිවා ආහාරය සැපයීම වෙනුවෙන් ගෙවීම් කිරීම. | 2,550.00 | නිර්දේශ කරන ලදී. |
| 06. | එම්.එස්.කේ.මහානායක මයා, ආදායම් පරීක්ෂක - 2023 සැප්තැම්බර් මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම. | 2,500.00 | නිර්දේශ කරන ලදී. |
| 07. | ආර්.එම්.පී.අශෝකා මිය, පුස්තකාල සහයක - මහජන පුස්තකාල සේවක පුහුණුව සඳහා බදුල්ල පළාත් පුස්තකාලයට යාම වෙනුවෙන් 2023/09/27 ගමන් වියදම් ගෙවීම. | 980.00 | නිර්දේශ කරන ලදී. |
| 08. | ඒ.එම්.විජිත ප්‍රියන්ත මයා, රියදුරු - කාර්යාලය රාජකාරි සඳහා 2023/09/01,04,05,07,21,22,24,25 ගමන් වියදම් ගෙවීම. | 5,600.00 | නිර්දේශ කරන ලදී. |

| | | | |
|---|---|---|---|
| 09. | වයි.එම්.නුවන් හර්ෂණ මයා, රියදුරු - කාර්යාලය රාජකාරි සඳහා 2023/09/04,08,13,19,22,25,26 ගමන් වියදම් ගෙවීම. | 4,900.00 | නිර්දේශ කරන ලදී. |
| 10. | ඩී.එම්.ජී.දිසානායක මයා, රියදුරු - මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ රාජකාරි කටයුතු සඳහා 2023/8/06,07,08 දින සඳහා ගමන් වියදම් ගෙවීම. | 2,100.00 | නිර්දේශ කරන ලදී. |
| 11. | ඩී.එම්.ජී.දිසානායක මයා, රියදුරු - මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ රාජකාරි කටයුතු සඳහා 2023/8/06,07,08 දින සඳහා අතිකාල දීමනා ගෙවීම. | 5,430.67 | නිර්දේශ කරන ලදී. |
| 12. | ආර්.ආනන්ද ජයරත්න මයා, සෞඛ්‍ය කම්කරු - මීගහකිවුල නගරය පිරිසිදු කිරීම වෙනුවෙන් 2023/09/23,24 දින සඳහා අතිකාල දීමනා ගෙවීම. | 2,438.27 | නිර්දේශ කරන ලදී. |
| 13. | ආර්.ආනන්ද ජයරත්න මයා, සෞඛ්‍ය කම්කරු - මීගහකිවුල නගරය පිරිසිදු කිරීම වෙනුවෙන් 2023/09/28,29 දින සඳහා නිවාඩු දින වැටුප් ගෙවීම. | 2,053.32 | නිර්දේශ කරන ලදී. |
| 14. | බී.එම්.හිරන්ත ලක්ෂාන මයා, කාර්මික නිලධාරි - 2023 මැයි මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම. | 5,600.00 | නිර්දේශ කරන ලදී. |
| 15. | කළමනාකරු, නිමල් මෝටර්ස්, අංක 10, පදියතලාව පාර, මහියංගණය - UPRD9389 ට්‍රැක්ටර් රථය අළුත්වැඩියාව සිදු කිරීම සඳහා අවශ්‍ය උපාංග මිළදී ගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම.(බිල්පත් අංක - 18568) | 6,500.00 | නිර්දේශ කරන ලදී. |
| 16. | කළමනාකරු. සෙනුක ටයර් හවුස්, කන්දකැටිය - මීගහකිවුල ප්‍රාදේශීය සභාව සතු RD6200 ට්‍රැක්ටර් රථයේ ටයර් පැච් එක හා ටියුබ් 01 යෙදීම වෙනුවෙන් ගෙවීම් කිරීම.( බිල්පත් අංක - 45,48) | 13,900.00 | නිර්දේශ කරන ලදී. |
| 17. | ඩී.එම්.ප්‍රේමාවතී මිය, මහජන පුස්තකාලය, පිටමාරුව - 2023 වර්ෂයේ ජුලි, අගෝස්තු, සැප්තැම්බර් මාස වල පිමාරුව සතිපොළෙහි බදු මුදල් එකතු කිරීම වෙනුවෙන් දීමනා ගෙවීම. | 3,000.00 | නිර්දේශ කරන ලදී. |
| 18. | හේෂාන් ඉංජිනියරින් වර්ක්ස්, 16 කණුව, ඉමකඳුර, මීගහකිවුල - මීගහකිවුල ප්‍රාදේශීය සභාවට අයත් කෝමාරික, වෙලන්ලන්ද, කෙසෙල්වත්ත ජල යෝජනා ක්‍රම වල හිඟ ආදායම් එකතු කිරීම සඳහා ශබ්ද විකාශන යන්ත්‍රය භාවිතා කිරීම වෙනුවෙන් ගෙවීම් කිරීම.(බිල්පත් අංක - 543) | 2,000.00 | නිර්දේශ කරන ලදී. |
| 19. | හේෂාන් ඉංජිනියරින් වර්ක්ස්, 16 කණුව, ඉමකඳුර, මීගහකිවුල - මීගහකිවුල ප්‍රාදේශීය සභාව විසින් ක්‍රියාත්මක කිරීමට නියමිත ඩෙංගු මර්දන වැඩසටහනේ ජනතාව කොට්ඨාශ මට්ටමින් දැනුවත් කිරීම සඳහා ශබ්ද විකාශන යන්ත්‍රය භාවිතා කිරීම වෙනුවෙන් ගෙවීම් කිරීම.(බිල්පත් අංක - 542) | 4,000.00 | නිර්දේශ කරන ලදී. |
| 20. | ආර්.එම්.ටී.සඳරුවන් මයා, මහජන සෞඛ්‍ය පරීක්ෂක, තල්දෙන - මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ සෞඛ්‍ය හා ඩෙංගු සම්බන්ධ රාජකාරි කටයුතු සඳහා 2023 සැප්තැම්බර් මස ක්ෂේත්‍ර රාජකාරි සිදු කිරීම වෙනුවෙන් ගෙවීම් කිරීම. | 2,000.00 | නිර්දේශ කරන ලදී. |
| 21. | ආර්.එම්.තිමිර ධනංජය නිශ්ශංඛ මයා, මහජන සෞඛ්‍ය පරීක්ෂක. මීගහකිවුල - මීගහකිවුල බල ප්‍රදේශයේ 2023 ජුලි මස සිට ඔක්තෝම්බර් මස දක්වා සිදු කරන ලද ආහාර සාම්පල් ලබා ගැනීම, ආහාර පවතින නඩු කටයුතු සඳහා මුද්‍රණය කිරීම හා ලිපි ද්‍රව්‍ය ලබා ගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම. | 3,250.00 | නිර්දේශ කරන ලදී. |
| 22. | ආර්.එම්.තිමිර ධනංජය නිශ්ශංඛ මයා, මහජන සෞඛ්‍ය පරීක්ෂක, මීගහකිවුල - මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ සෞඛ්‍ය හා ඩෙංගු | 1,204.00 | නිර්දේශ කරන ලදී. |

| | | | |
|---|---|---|---|
| | සම්බන්ධ රාජකාරි කටයුතු සඳහා 2023 ජුලි මස ක්ෂේත්‍ර රාජකාරි සිදු කිරීම වෙනුවෙන් ගෙවීම් කිරීම. | | |
| 23. | ආර්.එම්.තිමිර ධනංජය නිශ්ශංඛ මයා, මහජන සෞඛ්‍ය පරීක්ෂක, මීගහකිවුල - මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ සෞඛ්‍ය හා ඩෙංගු සම්බන්ධ රාජකාරි කටයුතු සඳහා 2023 අගෝස්තු මස ක්ෂේත්‍ර රාජකාරි සිදු කිරීම වෙනුවෙන් ගෙවීම් කිරීම. | 1,204.00 | නිර්දේශ කරන ලදී. |
| 24. | ආර්.එම්.තිමිර ධනංජය නිශ්ශංඛ මයා, මහජන සෞඛ්‍ය පරීක්ෂක, මීගහකිවුල - මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ සෞඛ්‍ය හා ඩෙංගු සම්බන්ධ රාජකාරි කටයුතු සඳහා 2023 සැප්තැම්බර් මස ක්ෂේත්‍ර රාජකාරි සිදු කිරීම වෙනුවෙන් ගෙවීම් කිරීම. | 1,186.00 | නිර්දේශ කරන ලදී. |
| 25. | කළමනාකරු, ඉමිටියාස් පකීර්දින් ආයතනය, බදුල්ල - 9X4 ලිපි කවර 5000 සහ පෙන්ඩ්‍රයිව් (8GB) 07ක් මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම.(බිල්පත් අංක -34152) | 24,800.00 | නිර්දේශ කරන ලදී. |
| 26. | ආර්.එම්.එල්.ජේ.රත්නායක මයා, කාර්මික නිලධාරී - රාජකාරි කටයුතු සඳහා බල ප්‍රදේශයෙන් බැහැරට යාම වෙනුවෙන් 2023/05/16,29,30 දින සඳහා ගමන් වියදම් ගෙවීම. | 1,700.00 | නිර්දේශ කරන ලදී. |
| 27. | ආර්.එම්.එල්.ජේ.රත්නායක මයා, කාර්මික නිලධාරී - 2023 මැයි මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම. | 3,740.00 | නිර්දේශ කරන ලදී. |
| 28. | සභාපති, ග්‍රාම සංවර්ධන සමිති බල මණ්ඩලය, මීගහකිවුල - LDSP PT2 ව්‍යාපෘතිය යටතේ පෙරටු කාර්යාලය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය සඳහා අවසන් බිල්පතට අදාළ අතරුඳවුම් මුදල 10% නිදහස් කර ගෙවීම.(85310503 ගිණුමෙන්) | 135,051.10 | නිර්දේශ කරන ලදී. |
| 29. | සභාපති, සැමට සෙත ග්‍රාම සංවර්ධන සමිතිය, කරමැටිය, මීගහකිවුල - LDSP PT2 ව්‍යාපෘතිය යටතේ කරමැටිය සතිපොල කඩ කාමර සඳහා රෝලර් දොරවල් සවි කිරීමේ ව්‍යාපෘතිය සඳහා අවසන් බිල්පතට අදාළ අතරුඳවුම් මුදල 10% නිදහස් කර ගෙවීම.(85310503 ගිණුමෙන්) | 125,353.07 | නිර්දේශ කරන ලදී. |
| 30. | ඩී.එම්.අයි.එස්.දිසානායක මයා - LDSP PT2 ව්‍යාපෘතිය යටතේ මීගහකිවුල ජල යෝජනා ක්‍රම සඳහා අවශ්‍ය ජල නල උපාංග මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම. (85310503 ගිණුමෙන්) (බිල්පත් අංක -2941) | 25,190.00 | නිර්දේශ කරන ලදී. |

b. මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ සේවයේ නියුතු කොන්ත්‍රාත් පදනමින් බඳවා ගන්නා ලද සේවකයින් , ආදේශක පදනමින් බඳවා ගන්නා ලද සේවකයින් හා අනියම් සේවකයින් සඳහා 2023 ඔක්තෝම්බර් මස වැටුප් ගෙවීම සඳහා අවශ්‍ය නිර්දේශය ලබා දීම සුදුසු බව කළමනාකරණ කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

II. මීගහකිවුල ප්‍රාදේශීය සභාව සතු මීගහකිවුල සතිපොළ භූමිය පවතින ස්ථානය සතිපොල තිබෙන දවස් හැර අනෙකුත් දින වල එම ගොඩනැගිල්ල ආර්ථික මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම සම්බන්ධව සාකච්ඡා කරන ලද අතර එම ගොඩනැගිල්ල සමෘද්ධි ආයතනයෙන් පුහුණු කල කාන්තාවන් සඳහා ආදායම් මාර්ගය වැඩි දියුණු කිරීම සඳහා ස්වයං රැකියා අවස්ථාවක් උදා කර දීමට එම ගොඩනැගිල්ල භාවිතා කිරීම සඳහා අවශ්‍ය නිර්දේශය ලබා දීම සුදුසු බව කළමනාකරණ කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

III. 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය හා පළාත් පාලන කොමසාරිස්ගේ අංක 12/04/8/1/2022 හා 2023.03.22 දිනැති ලිපිය මගින් ලබා දී ඇති උපදෙස් සැලකිල්ලට ගෙන 2020 ප්‍රාදේශීය සභා අයවැය සම්පාදන හා බලාත්මක කිරීමේ රීති මගින් නියමකර ඇති

මහා සභාවට යොමු කළ යුතු යන රීති සම්බන්ධයෙන් වන අවස්ථාවනදී ඒ සඳහා අවශ්‍ය නිර්දේශය ලබා දීම සුදුසු බව කළමනාකරණ කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

IV. මීගහකිවුල ප්‍රාදේශීය සභාව සතු මීගහකිවුල කාර්යාලය ඉදිරිපිට කඩ කාමරය 2023.07.01 දින සිට බදු පදනම මත ලබා දෙන අතර 2023.12.31 දිනෙන් ගිවිසුම් කාලය අවසන් වේ. එම කඩ කාමරය බදු පදනම මත ලබා ගත් එච්.එම්.ධනුෂි වත්සලා මහත්මිය විසින් 2024 වර්ෂය සඳහා බදු පදනම මත පවත්වා ගෙන යාම සඳහා ඉල්ලීමක් කර ඇත. ඒ සම්බන්ධ 2013.06.28 දින ගැසට් පත්‍රයේ අතුරු ව්‍යවස්ථාවේ දිනැති අංක 15 වැනි කොටසේ, 34(i) යටතේ සඳහන් ආකාරයට අනුගාමී ඉදිරි වර්ෂය සඳහා ටෙන්ඩර් ක්‍රියාපටිපාටියෙන් තොරව දැනට කඩ පවත්වාගෙන යන පාර්ශවය වෙත ලබා දීම සුදුසු බව කළමනාකරණ කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

V. මීගහකිවුල ප්‍රාදේශීය සභාව සතු සතිපොලවල් හා පොදු පහසුකා මධ්‍යස්ථානය බදු දීමට අදාලව තක්සේරුව සිදු කර ගැනීමට තක්සේරු දෙපාර්තමේන්තුව වෙත යවන ලද ලිපිය සම්බන්ධයෙන් එම දෙපාර්තමේන්තුව විසින් එවන ලද අංක BD/RP/පොදු හා 2023/10/09 දිනැති ලිපියට අනුව එම දේපල තක්සේරු සිදු කර ගැනීමේ ක්‍රමවේදය හා දෙපාර්ශවය අතර ගිවිසුම් ගත වීමේ ගිවිසුම් කොන්දේසි පත්‍රය අමුණා ඇත. මේ සම්බන්ධව දන්වා ඇති පරිදි ගිවිසුම් ගත වීමට හා මුදල් ගෙවීම සඳහා අවශ්‍ය නිර්දේශය ලබා දීම සුදුසු බව කළමනාකරණ කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

VI. මීගහකිවුල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය පිහිටා ඇත්තේ මීගහකිවුල ප්‍රාදේශීය සභාවට අයත් භූමියේ වන අතර, එම ඉඩම් කොටස ඔවුන් වෙත පවරාදීමට අවශ්‍ය කටයුතු කිරීමට සභාවේ එකඟතාවය ලබාදෙන මෙන් ඉල්ලීමක් සිදු කර ඇත.

මීගහකිවුල ප්‍රාදේශීය සභාව පිහිටා ඇති ඇමිතිල්ලන් කැටිය මුත්තෙටවුවගොඩ යන මෙම ඉඩම 1965.10.19 දින ඩී.එම්.ධනවති මැණිකේ මහත්මිය විසින් එවකට පැවැති මීගහකිවුල ගම් සභාවේ සභාපතිවරයා වෙත හිමිකම් පවරා දී ඇත. ඉන් අනතුරුව, 1992 වර්ෂයේ මීගහකිවුල ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගොඩනැඟිල්ල පෙර දැනුම්දීමකින් තොරව ඉදි කිරීම ආරම්භ කර ඇති අතර, පසුව මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ එකඟතාවයක් ලබාදීමට කටයුතු කර ඇත. එවකට පැවැති මහ සභාව විසින් එම එකඟතාවයද ලබාදී ඇත්තේ සභාව විසින් ලබාදෙන ඉඩම් කොටසට අදාලව වෙනත් සුදුසු ඉඩම් කොටසක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ලබාදීමේ පදනම මත බව ලේඛන පරීක්ෂා කිරීමේදී නිරීක්ෂණය විය. එනමුත්, මීගහකිවුල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ලබාගත් ඉඩම් කොටසට මේ දක්වාද ඉඩම් කොටසක් ලබාදී නොමැත.

2023.10.11 දින ඌව පළාතේ ගරු ආණ්ඩුකාරතුමාගේ විසින් මීගහකිවුල නව බස් නැවතුම්පොල ඉදි කිරීම සම්බන්ධව සිදු කරන ලද නිරීක්ෂණ චාරිකාවේදී ද මීගහකිවුල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ඉඩම් කොටස ලබාදීම සම්බන්ධව කරුණු ඉදිරිපත් වී ඇති අතර, ප්‍රාදේශීය ලේකම් විසින් ඔවුන්ගේ ගොඩනැඟිල්ල පවත්නා ඉඩම කොටසට අමතරව පර්චස් 10ක කොටසක් ලබාදෙන මෙන් ගරු ආණ්ඩුකාරතුමා වෙතින් ඉල්ලීමක්ද සිදු කර ඇත. 2023.10.21 වන දින නැවත ගරු ආණ්ඩුකාරතුමා සහ ගරු රාජ්‍ය අමාත්‍ය තේණුක විදානගමගේ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පළාත් පාලන කොමසාරිස්, ප්‍රාදේශීය ලේකම්, රාජ්‍ය නිලධාරින් සහ හිටපු ගරු සභාපතිතුමා ඇතුළු මහජන නියෝජිතයින්ගේ සහභාගිත්වයෙන් පවත්වා ඇති සාකච්ඡාවේදි 1965 වර්ෂයේ මෙම ඉඩම ප්‍රාදේශීය සභාව වෙත පෞද්ගලිකව ලබාදී තිබුණද 1980 වර්ෂයේ පැවැති ඉඩම් කච්චේරියේදි රජය සතු ඉඩමක් ලෙස අවසාන ගම් සිතියමේ සඳහන්ව ඇති බැවින් සභාව සතු නොවන බව ප්‍රාදේශීය ලේකම් විසින් කරුණු දන්වා ඇත.තවද, එම ඉඩම කච්චේරියෙන් පසුව ඇති ගම් සහා සිතියම මේ වනවිට නීත්‍යානුකූව පිළිගන්නා බව පළාත් පාලන කොමසාරිස්තුමා විසින්ද පැහැදිලි කර තිබේ.

ඒ අනුව, ගරු ආණ්ඩුකාරතුමා විසින් පවසා ඇත්තේ ප්‍රාදේශීය සභාව සතුව ඔප්පු පැවැතුණද අවසන් ගම් සහා සිතියමේ හා එහි සටහන් උපලේඛන වල රජය ලෙස සඳහන්ව ඇති බැවින් සම්පූර්ණ ඉඩමින් ප්‍රාදේශීය

ලේකම් කාර්යාලයට අයත් ඉඩම් කොටස වෙන් කරදීමටත් , සභාව විසින් මේ වන විට භුක්ති විඳින ඉඩම් කොටසින් ප්‍රාදේශිය ලේකම් විසින් ඉල්ලුම් කරන පර්චස් 10ක කොටස ප්‍රාදේශිය ලේකම් කාර්යාලය වෙත පවරා දීමට කටයුතු කළ යුතු බවයි.

මේ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කිරීමට අවශ්‍ය නිතීමය උපදෙස් ලබා ගැනීම සඳහා අවශ්‍ය නිර්දේශය ලබා දීම සුදුසු බව කළමනාකරණ කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

දිනට නියමිත කරුණු අවසන් බැවින් හා සාකච්ඡා කිරීමට වෙනත් කාරණා නොමැති බැවින්, සභා ලේකම්තුමියගේ ස්තුති කතාවෙන් අනතුරුව කළමනාකරණ කමිටුව පෙ.ව.10.30ට අවසන් කරන ලදී.

**කමිටු සාමාජිකයින්:-**

1) ඩී.එම්.කේ.ඩී.දිසානායක මෙනවිය (සභාපති) - Krishantha
2) ඩබ්.ඒ.එස්.ආර්.විජේසිංහ මහතා (කමිටු සාමාජික) -
3) ආර්.එම්.එල්.ජේ.රත්නායක මහතා (කමිටු සාමාජික) -
4) ජී.කේ.ද සොයිසා මහත්මිය (කමිටු සාමාජික) -
5) ඒ.ජී.චිත්‍රා මල්කාන්ති මහත්මිය (කමිටු සාමාජික) -
6) කේ.තරිඳු දර්ශන ප්‍රියකැළුම් මහතා (කමිටු සාමාජික) -